GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

04.04.2025

මාධ්‍ය නිවේදනය

**මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි තරුණියක් විසින් සිදු කරන ලද පැමිණිල්ල**

මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ බාහිර රෝගී අංශයට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි තරුණියක්, එහිදී ඇයව පරීක්ෂා කළ වෛද්‍යවරයෙක් විසින් ලිංගික හිංසනයකට ලක් කරනු ලැබුවේ යයි සිදු කරන ලද පොලිස් පැමිණිල්ලක් පිළිබඳ තොරතුරු මාධ්‍ය හරහා වාර්තා වී ඇත.

අදාල සිදුවීම සම්බන්ධයෙන්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මීගමුව දිස්ත්‍රික් මහ රෝහල් ශාඛාවෙන් ලබාගත් තොරතුරු වලට අනුව මෙම සිදුවීමට අදාල වෛද්‍යවරයා, අප සංගමයේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් විනය විරෝධීව හැසිරීම හේතුවෙන් වසර කීපයකට පෙර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකත්වයෙන් නෙරපා හරින ලද අයෙකු බව තහවුරු කරන ලදී.

එසේ වුවත්, රජයේ රෝහලක් තුළ සිදුවුණු මෙම බරපතල සිදුවීම සම්බන්ධයෙන් අපක්ෂපාති පරීක්ෂණයක් සිදුකර වහාම නීතිය ක්‍රියාත්මක කර වැරදිකරුවන් සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගත යුතු බව අප විශ්වාස කරන අතර, එම විමර්ශන සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ උපරිම සහයෝගය ද ලබාදෙනු ඇත.

සෞඛ්‍ය සේවාව තුළ පමණක් නොව සමස්ත සමාජය තුළද කාන්තාවගේ ආරක්ෂාව තහවුරු විය යුතු බව අප තරයේ විශ්වාස කරන අතර ඒ වෙනුවෙන් වඩා ශක්තිමත් ප්‍රතිපත්තියක් සහ වැඩපිළිවෙළක් ඉදිරියේදී ස්ථාපිත කිරීම වෙනුවෙන් අවශ්‍ය නායකත්වය ලබාදීමට ද රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සූදානම් බව අවධාරණය කරමු.

ස්තුතියි.
මීට විශ්වාසී,

වෛද්‍ය ප්‍රභාත් සුගතදාස,
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

| | | |
|---|---|---|
| වෛද්‍ය චමිල් විජේසිංහ(මාධ්‍ය ප්‍රකාශක) | - | 0717080041 |
| වෛද්‍ය පාලිත රාජපක්ෂ | - | 0718480300 |
| වෛද්‍ය අජන්ත රාජකරුණා | - | 0766736296 |
| වෛද්‍ය වසන්ත වීරසූරිය ආරච්චි | - | 0773526063 |
| වෛද්‍ය දිනිඳු රණසිංහ | - | 0715535950 |
| වෛද්‍ය හංසමාල් වීරසූරිය | - | 0776549339 |
| වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ | - | 0777829001 |
| වෛද්‍ය අන්ෆාස් ෆාරුක් | - | 0771115117 |